IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2016/2017

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2019 ජුනි)

## BLE 205 - කම්කරු නීතිය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) මෙම ප්‍රශ්න පත්‍රය <u>ප්‍රශ්න අට (08) කින්</u> සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(2) <u>ඕනෑම ප්‍රශ්න පහ (05) කට පමණක්</u> පිළිතුරු සැපයිය යුතු වේ.

(3) පිළිතුරු සැපයීමේදී <u>නඩු තීන්දු සහ ව්‍යවස්ථා</u> පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

(4) කාලය පැය තුනයි. (03)

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම මාතෘකා දෙක (02) ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. තාවකාලික සේවා නියුක්තිය සහ අනියම් සේවා නියුක්තිය අතර පැහැදිලිව පෙනෙන වෙනසක් නැත.

ii. විෂමාචාර ක්‍රියා මත සේවකයෙකුගේ සේවය අවසන් කිරීම.

iii. නිශ්චිත කාලීන සේවා ගිවිසුමක ගිවිසුම්ක කාලය අවසන් වීම මත, සේවා සමාප්තියට එරෙහිව කම්කරු විනිශ්චය සභාවකින් සහන ඉල්ලා සිටීම.

(ලකුණු 10x2=20)

**(මුළු ලකුණු 20)**

02. "ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප ආශ්‍රිතව ශ්‍රමය සපයන සේවක - සේවිකාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කොට තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ගේ ආරක්ෂණය ද සහිතව ක්‍රියාත්මක වන දේශීය නෛතික රාමුව වඩා ඵලාදායී වේ."

උක්ත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? විවේචනාත්මකව විමර්ශනය කරන්න.

**( ලකුණු 20)**

03. සිරිපාල මහතා සිරිපාල සමූහ ව්‍යාපාරයේ හිමිකරු වේ. සිරිපාල අයිස්ක්‍රීම් නිෂ්පාදකයෝ, සිරිපාල මුද්‍රණ ශිල්පියෝ, සිරිපාල ආරක්ෂක සමාගම සහ සිරිපාල ඉදිකිරීම් සමාගම මෙම සමූහ ව්‍යාපාරය යටතේ ක්‍රියාත්මක වේ.

කරුණාරත්න නම් තැනැත්තා අයිස්ක්‍රීම් නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරන්නෙකු ලෙස සේවයට බඳවා ගෙන ඇත. ඔහු සම්පූර්ණයෙන්ම සිරිපාල ගේ උපදෙස්, නියෝග, විධාන, පාලනය සහ අධීක්ෂණයට යටත්ව සේවය සපයයි.

දයාවංශ නම් තැනැත්තා ගේට්ටු ආරක්ෂක නිලධාරියකු ලෙස සේවයට බඳවා ගෙන ඇත. සිරිපාල ආරක්ෂක සමාගම නවෝදය උසස් අධ්‍යාපන ආයතනය සමග ඇතිකර ගනු ලැබූ ගිවිසුම ප්‍රකාරව ඇඳුම්, ආරක්ෂක උපකරණ ආදිය සපයා නවෝදය උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන ගේට්ටුව භාර ආරක්ෂක නිලධාරි ලෙස දයාවංශ සේවයේ යොදවා ඇත.

සිරිපාල මුද්‍රණාලයේ සියලුම මුද්‍රණ කටයුතු සිදුකරනු ලබන ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට, මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරන්නෙකු ලෙසට මුණසිංහ සේවයට බඳවා ගෙන ඇත. මුණසිංහ එම ආයතනයේ සිටින එකම ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු වේ.

ගුණපාල, මේසන් බාස් කෙනෙකු ලෙස සේවයට බඳවාගෙන ඇත. සිරිපාල ඉදිකිරීම් සමාගම විසින් කුසුමලතා මහත්මියට නිවසක් ඉදිකර දීම සඳහා එකඟ වූ ගිවිසුම අනුව ගුණපාලව සේවයේ යොදවා ඇත. ගුණපාල කුසුමලතා මහත්මියගේ නිවස සාදයි.

මෙම විස්තරයට අනුව සිරිපාල මහතා සහ කරුණාරත්න, දයාවංශ, මුණසිංහ සහ ගුණපාල අතර ඇත්තේ කවර ආකාරයේ ගිවිසුම්ක සබඳතාවක් ද?

එසේම, සිරිපාල මහතා සහ නවෝදය උසස් අධ්‍යාපන ආයතනය සහ කුසුමලතා මහත්මිය අතර ඇත්තේ කවර ආකාරයේ ගිවිසුම්ක සබඳතාවක් ද?

( ලකුණු 20)

04. "ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ ශ්‍රමය සපයන කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් නගා සිටුවීම උදෙසා, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය විසින් ඓතිහාසිකව සිට මේ දක්වා කලින් කලට ව්‍යවස්ථා සම්පාදනය කොට කම්කරු නීති පනවා ක්‍රියාත්මක කර ඇත."

ඓතිහාසිකව සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ විකාශනය වූ කම්කරු ව්‍යවස්ථා පිළිබඳව අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශය පිළිබඳව සාකච්ඡා කරන්න.

( ලකුණු 20)

05. අසාධාරණ සහ අයුක්තිසහගත ලෙස සේවකයින්ගේ සේවය අවසන් කිරීම නියාමනය කිරීමටත්, සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත්, සේවකයින්ගේ සේවය අවසන් කිරීමක දී ප්‍රතිලාභ හිමිකර දීමත් අරමුණු කරගෙන 1971 අංක 45 දරණ සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක වේ. අදහස් දක්වන්න.

( ලකුණු 20)

06. "පරිවාසිකයකුගේ සේවය අදාළ ආයතනයට උචිත ද යන්න මැන බලන එකම විනිසුරුවරයා සේවායෝජකයා වේ. ඒ අනුව, පරිවාසිකයකුගේ සේවා සමාප්තියක දී අධිකරණයට පවා මැදිහත් විය නොහැක."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? සාකච්ඡා කරන්න.

( ලකුණු 20)

07. "වර්ෂ 1919 වෙසයිල්ස් සම්මුතිය/සාම සම්මුතිය මගින් බිහි වූ අන්තර්ජාතික කම්කරු සංවිධානය පුරා අවුරුදු සියයකට ආසන්න කාලයක් තිස්සේ සංවිධානගත වෙමින්, විවිධ සම්මුතීන් පනවමින් සමාජ යුක්තිය අභිවර්ධනය කිරීමටත්. විනය ගරුක, ශික්ෂා සම්පන්න වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක වෙමින් පවතී."

අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සාමාජික රටක් ලෙසට ශ්‍රී ලංකාව කෙරෙහි අන්තර්ජාතික කම්කරු සංවිධානයේ බලපෑම පිළිබඳව ද අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පිළිබඳව විමර්ශනාත්මකව අදහස් දක්වන්න.

(ලකුණු 20)

08. ජයංගනී මහත්මිය ජයංගනී කාන්තා සහ ළමා ඇඳුම් ව්‍යාපාරයේ හිමිකාරිය වේ. ඇයගේ ව්‍යාපාරයේ කාන්තා සේවිකාවන් විසිදෙනෙකු (20) සේවය කරයි.

සුමනාවතී මාසිකව වැටුප් ලබන අත් උදව්කාරියක ලෙස සේවයට පැමිණ පුරා අවුරුදු හය (06) ක් සේවය සපයා සේවය අතහැර යයි. ඇයගේ සේවය අවසන් වන විට ඇයගේ අවසන් මාසික වැටුප රුපියල් විසිදහස (රු. 20,000/-) ක් විය. ඇය සේවය අවසන් කළ දින සිට මාසයක් ගතවී ඇති නමුත් මාස තුනක් ගතවීමට පෙර ජයංගනී සුමනාවතීට පාරිතෝෂික මුදල් ගෙවයි.

රූපිකා ද ජයංගනී ඇඳුම් ව්‍යාපාරයේ දෛනිකව වැටුප් ලබන මැෂින් ක්‍රියාකරන්නියක ලෙස සේවයට පැමිණ පුරා අවුරුදු හත (07) ක කාලයක් සේවය සපයා සේවය අවසන් කර යයි. ඇය සේවය අවසන් කළ අවසන් මාසයේ දෛනික වැටුප රුපියල් දෙසිය පනහ (රු. 250/-) ක් විය. ඇය සේවය අවසන් කළ දින සිට මාස තුනක් ගතවී ඇති නමුත් මාස හයක් ගතවීමට පෙර ජයංගනී රූපිකාට පාරිතෝෂික මුදල් ගෙවනු ලබයි.

එසේම, විජේපාල ජයංගනී මහත්මියගේ පුද්ගලික රියදුරු ලෙස පුරා අවුරුදු අට (08) ක කාලයක් සේවය කර සේවය අත්හැර යයි. මාසිකව ඔහුට රුපියල් දස දහස (රු. 10,000/-) බැගින් වැටුප් ගෙවීය. තවද කුමාරි, ජයංගනී මහත්මියගේ නිවසේ ගෘහ මෙහෙකාරිය ලෙස පුරා අවුරුදු දහය (10) ක් සේවය කර සේවය අතහැර යයි. ඇයට ද මාසිකව රුපියල් දස දහස (රු. 10,000/-) බැගින් වැටුප් ගෙවා ඇත.

සුභද්‍රා ජයංගනී ඇඳුම් ව්‍යාපාරයේ ගිණුම් ලිපිකාරිණියක ලෙස පුරා අවුරුදු හය (06) ක කාලයක් සේවය කරයි. ඇයට මාසිකව රුපියල් පහළොස් දහස (රු. 15,000/-) බැගින් වැටුප් ගෙවා ඇත. ඇය ජයංගනී ව්‍යාපාරයේ ගිණුම් පොත් වංචා කරමින් රුපියල් ලක්ෂ දෙක (රු 200,000/-) ක මුදලක් සොරකම් කර ඇත.

මෙම ගැටලුට අනුව, සුමනාවතී, රූපිකා, විජේපාල, කුමාරි සහ සුභද්‍රා ඔවුන්ගේ සේවය අවසන් වන විට කොපමණ පාරිතෝෂික මුදලකට හිමිකම් ලබයිද?

ජයංගනී මහත්මිය පාරිතෝෂික මුදල් ගෙවීමට ප්‍රමාද වීම මත එක් එක් සේවක සේවිකාවන්ට අමතරව කොපමණ මුදලක් ගෙවීමට බැඳී සිටීද?

ඔබගේ පිළිතුර 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ ප්‍රතිපාදන ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 20)

****************************